CBC FINANCE
A Fully Owned Subsidiary of Commercial Bank of Ceylon PLC

මූලික තොරතුරු ආශ්‍රිත ලේඛණය - සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ්

සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් වෙතින් ලබාදෙන ප්‍රධානතම මූල්‍ය පහසුකම් සහ සේවාවන් පිළිබඳ තොරතුරු මෙම මූලික තොරතුරු ලේඛණයෙහි අඩංගු වේ.

<table>
<tr><th>මූල්‍යමය පහසුකම් / සේවාවන්</th><th>ඉලක්ක කණ්ඩායම සහ අවශ්‍ය ලේඛණ</th><th>සුදුසුකම් ලැබීමේ නිර්නායක</th><th>විශේෂ කරුණු සහ කොන්දේසි</th></tr>
<tr><td rowspan="2">ඉතුරුම් ගිණුම්

● සාමාන්‍ය</td><td>❖ තනි පුද්ගල / ඒකාබද්ධ
• නිසි පරිදි සම්පූර්ණ කරන ලද සී බී සී ෆිනෑන්ස් ලිමටඩ් හි ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත.
• වලංගු ජාතික හැදුණුම්පත හෝ ජාතික හැදුණුම් පත නොමැති නම් ජාතික හැදුණුම්පත් අංකය සදහන් වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය.
• ස්ථිර ලිපිනය සනාථ කිරීමේ ලේඛන (ජාතික හැදුණුම්පතේ සදහන් ලිපිනය හා නොගැලපේ නම් පමණි).
• KYC පෝරම (ගණුදෙණුකරු හදුනාගැනීම සම්බන්ධ තොරතුරු)</td><td>❖ වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් / ද්විත්ව පුරවැසියන්</td><td rowspan="2">• රුපියල් 1,000.00 ක අවම තැන්පතුවක් ගිණුමේ පවත්වාගෙන යා යුතුය. (අවම ශේෂය ගිණුමේ නොමැති විට පොලිය බැර කරනු නොලැබේ).

• පොලිය දිනපතා ගණනය කොට මාසිකව ගිණුමට බැර කරණු ලැබේ.

• ඉතිරිකිරිමේ ගිණුමට වෙක් තැන්පතු සිදුකල හැක්කේ කළමණාකාරිත්වයේ තීරණය මත පමණි.

• තැන්පතු / ආපසු ගැනීම් හා ශේෂය යනාදියට ලදුපත් ලබා ගත හැක.

• ගණුදෙණුකරුගේ ඉල්ලීම මත ගිණුම් වාර්තා නිකුත් කරනු ලැබේ.

• දේශිය ආදායම් දෙපාර්තුමේන්තුව මගින් නිකුත් කරනු ලබන නියෝග අනුව රදවා ගැනිමේ බද්ද (WHT) යොදවනු ඇත.</td></tr>
<tr><td>❖ සමාගම් / ඒකපුද්ගල ව්‍යාපාර / හවුල් ව්‍යාපාර / සමිති සමාජ හා සංගම් / භාරකාර අරමුදල්.
• නිසි පරිදි සම්පූර්ණ කරන ලද සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත.
• ව්‍යාපාර ලියාපදිංචි සහතිකය / සංස්ථාපන සහතිකය.
• සාංගමික ව්‍යවස්ථාවලිය.
• මණ්ඩල විසර්ජනය.
• අධක්ෂකවරුන්ගේ ලැයිස්තුව (Form -1) / අධක්ෂකවරුන්ගේ වෙනස්වීම් (Form - 20).
• සමාගම නැවත ලියාපදිංචි කර තිබේ නම් (From -40).
• ලියාපදිංචි සහතික / ව්‍යවස්ථාව හා රැස්වීම් වාර්තා .
• බලයලත් අත්සන්කරුවන් අනුමත කොට සහතික කරන ලද ලේඛණ
• වලංගු පුද්ගල හදුනාගැනිමේ ලියවිලි (බලයලත් අත්සන්කරුවන් ද ඇතුළුව)
• ස්ථිර ලිපිනය සනාථ කිරීම සදහා ව්‍යාපාරයේ නම සදහන් උපයෝගිතා බිල්පත් (ජල/විදුලි) හෝ බැංකු ප්‍රකාශන.
• KYC පෝරම (අධක්ෂකවරු / ව්‍යාපාර හිමියන් / හවුල්කරුවන් / බලයලත් අත්සන්කරුවන්).
• Beneficial Ownership ප්‍රකාශය.</td><td>❖ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ආඥාපනත යටතේ නිසි පරිදි ලියාපදිංචි කරන ලද ව්‍යාපාරයක් විය යුතුයි.</td></tr>
</table>

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2018 අංක 01 දරණ නියෝගය මත මූල්‍යමය පාරිභෝගික ආරක්ෂා පනතට අනුකූලව මෙම ලේඛණ ඉදිරිපත් කරන ලදි.

<table>
<tr>
<th>මූල්‍යමය පහසුකම් / සේවාවන්</th>
<th>ඉලක්ක කණ්ඩායම සහ අවශ්‍ය ලේඛණ</th>
<th>සුදුසුකම් ලැබීමේ නිර්නායන</th>
<th>විශේෂ කරුණු සහ කොන්දේසි</th>
</tr>
<tr>
<td rowspan="2">ස්ථාවර තැන්පත්
• සාමාන්‍ය
• ජ්‍යෙෂ්ඨ පුරවැසි</td>
<td>❖ තනි පුද්ගල / ඒකාබද්ධ /ජ්‍යෙෂ්ඨ පුරවැසි
• නිසි පරිදි සම්පූර්ණ කරන ලද සී බී සී ෆිනෑන්ස් ලිමටඩ් හි ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත.
• වලංගු ජාතික හැඳුණුම්පත හෝ ජාතික හැඳුණුම් පත නොමැති නම් ජාතික හැඳුණුම්පත් අංකය සදහන් වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය.
• ස්ථිර ලිපිනය සනාථ කිරීමේ ලේඛන (ජාතික හැඳුණුම්පතේ සදහන් ලිපිනය හා නොගැලපේ නම් පමණි).
• KYC පෝරම (ගණුදෙණුකරු හඳුනාගැනීම සම්බන්ධ තොරතුරු)
• ජ්‍යෙෂ්ඨ පුරවැසි බද්ධගිණුම් සඳහා- ජ්‍යෙෂ්ඨ පුරවැසි පොලී අනුපාතය ලබාගැනීමට හැකිවනුයේ සියළුම බද්ධ ගිණුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් නම් පමණි.</td>
<td>❖ වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලංකික පුරවැසියන් / ද්විත්ව පුරවැසියන්
• ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වයස අවුරුදු 60 ට වැඩි විය යුතුයි.</td>
<td rowspan="2">• අවම තැන්පතුව රුපියල් 100,000.00 ක් වේ.
• තැන්පතු කාලය මාස 01 සිට මාස 60 දක්වා.
• වාර්ෂික පොලී අනුපාතය මත මාසිකව, වාර්ෂිකව හා කල්පිරිමේ දි පොලිය ගෙවනු ලැබේ.
• මාසිකව පොලී ගෙවීමේ දී, එකග වූ වාර්ෂික පොලී අනුපාතය මත ගණනය කර එය 365 (වාර්ෂික දින ගණන) න් බෙදා අදාළ මාසික දින ගණනින් වැඩිකර ගණනය කරනු ලැබේ.
• ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍යමය බුද්ධි අංශයේ අවශ්‍යතාවලට අනුකූලව අවශ්‍ය තොරතුරු සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් වෙත ලබා දීමට කිසියම් ගණුදෙණුකරුවකු අපොහොසත් වන්නේ නම් එම තැන්පතු ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ බලය සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් සතුවේ.
• ගනුදෙණුකරුගේ ඉල්ලීම මත ශේෂ සහතික, ආදායම් දෙපාර්තුමේන්තු සහතික, රඳවා ගැනීමේ බදු සහතික සහ ආගමන විගමන දෙපාර්තුමේන්තුව වෙත ලිපි නිකුත් කරනු ඇත.
• ස්ථාවර තැන්පත මත ණය ලබා ගැනීම
(i) වාර්ෂිකව පොලී ලබන තැන්පතු සඳහා 90% අනුමත කෙරේ.
(ii) මාසිකව පොලී ලබන වාර්ෂික තැන්පතු සඳහා 90% අනුමත කෙරේ.
(ණය අනුපාතය සාමාන්‍ය පවතින අනුපාත (APR) මත 3% වැඩිපුර අයකරනු ඇත).
• ශ්‍රී ලංකා මහබැංකුවේ නියෝග හා සි බි සි ෆිනෑන්ස් ලිමිටඩ් හි ප්‍රතිපත්ති මත දඩ මුදලකට යටත්ව කල්පිරීමට පෙර වූ තැන්පතුව ආපසු ලබා ගැනීම අනුමත කෙරේ.
• කල්පිරීමට පෙර ස්ථාවර තැන්පතු ආපසු ගැනීමේ දී හානි පූර්ණය :
- තැන්පතුව පැවති කාලයට අදාල පොලි අනුපාතය කල්පිරීමට පෙර වූ තැන්පතු සදහා යොදනු ලැබේ.
- මාසික පොලී ක්‍රමය යටතේ පැවති තැන්පතු සඳහා වැඩිපුර ගෙවා ඇති පොලිය තැන්පත් මුදලින් අයකරනු ලැබේ.
• ස්ථාවර තැන්පතු සහතිකය නොමැතිව කල්නොපිරුණු තැන්පතු සඳහා ගෙවීම් සිදු කරනු නොලැබේ.
• නැතිවූ හෝ හානි වූ ස්ථාවර තැන්පතු සහතික සඳහා අනුපිටපතක් නිකුත් කරනුයේ දිවුරුම් ප්‍රකාශය සහ සි බි සි ෆිනෑන්ස් ලිමිටඩ් හි හානි පූර්ණ ලියවිලි ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.
• දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තුවේ නිර්දේශ මත රඳවා ගැනීමේ බද්ධ (WHT) යොදවනු ඇත.
• මූල්‍යමය මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන ‘තැන්පතු රක්ෂණ’ ක්‍රමය යටතේ සෑම තැන්පතුවක්ම ආවරණය වන අතර එක් තැන්පතුකරුවකුට රුපියල් 1,100,000.00 ක් දක්වා වූ වන්දි මුදලක් හිමි වේ.
• අදාල අයදුම්පත ‘වෙබ්’ අඩවිය මගින් ලබාගත හැක.
• තැන්පතු අළුත් කිරීමේ නිවේදනය ගණුදෙනුකරුවන් වෙත එවනු ලැබේ.
• නාමකරණ පහසුකම් (අවශ්‍ය නම්)
• ස්ථාවර නියෝග පහසුකම්</td>
</tr>
<tr>
<td>❖ සමාගම් / ඒකපුද්ගල ව්‍යාපාර / හවුල් ව්‍යාපාර / සමිති සමාජ හා සංගම් / භාරකාර අරමුදල්.
• නිසි පරිදි සම්පූර්ණ කරන ලද සී බි සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත.
• ව්‍යාපාර ලියාපදිංචි සහතිකය / සංස්ථාපන සහතිකය.
• සාංගමික ව්‍යවස්ථාවලිය.
• මණ්ඩල විසර්ජනය.
• අධක්ෂකවරුන්ගේ ලැයිස්තුව (Form -1) / අධක්ෂකවරුන්ගේ වෙනස්වීම් (Form - 20).
• සමාගම නැවත ලියාපදිංචි කර තිබේ නම් (From -40).
• ලියාපදිංචි සහතික / ව්‍යවස්ථාව හා රැස්වීම් වාර්තා .
• බලයලත් අත්සන්කරුවන් අනුමත කොට සහතික කරන ලද ලේඛණ
• වලංගු පුද්ගල හඳුනාගැනීමේ ලියවිලි (බලයලත් අත්සන්කරුවන් ද ඇතුළුව)
• ස්ථිර ලිපිනය සනාථ කිරීම සඳහා ව්‍යාපාරයේ නම සදහන් උපයෝගිතා බිල්පත් (ජල/විදුලි) හෝ බැංකු ප්‍රකාශන.
• KYC පෝරම (අධක්ෂකවරු / ව්‍යාපාර හිමියන් / හවුල්කරුවන් / බලයලත් අත්සන්කරුවන්.
• Beneficial Ownership ප්‍රකාශය</td>
<td>❖ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ආඥාපනත යටතේ නිසි පරිදි ලියාපදිංචි කරන ලද ව්‍යාපාරයක් විය යුතුය.</td>
</tr>
</table>

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2018 අංක 01 දරණ නියෝගය මත මූල්‍යමය පාරිභෝගික ආරක්ෂා පනතට අනුකූලව මෙම ලේඛණ ඉදිරිපත් කරන ලදි.

මූල්‍යමය පහසුකම් / සේවාවන්	ඉලක්ක වෙළඳපොළ සහ ප්‍රධාන කරුණු	සුදුසුකම් ලැබීමේ නිර්නායක	විශේෂ කරුණු සහ කොන්දේසි
ව්‍යාපාරික ණය	❖ **ණය අයදුම්කරුවන්** • තනි පුද්ගලයින් • ඒක පුද්ගල ව්‍යාපාර • හවුල් ව්‍යාපාර • සීමිත වගකීම් සමාගම් ❖ **ණය අයදුම්කරුගේ ණය ලබාගැනීමේ නිර්නායන සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ණය දෙන නිර්දේශය හා අනුකූල විය යුතුයි.** ❖ **ණය අයදුම්කරු ඇගයීමේ කොටසක් වශයෙන් ණය දෙන නිලධාරින් (නිවෙස්/ව්‍යාපාර) ස්ථාන වෙත පැමිණේ.** ❖ **ණය අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ණය අයදුම්පත සහ එහි සඳහන් අදාල ලියකියවිලි ඉදිරිපත් කල යුතුයි.**	❖ අයදුම්කරු ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතු අතර ණය ලබා ගැනීම සඳහා වූ නීත්‍යානුකූල වයස තුල සිටිය යුතුයි. ❖ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම අඥාපනත යටතේ නිසි පරිදි ලියා පදිංචි කල ව්‍යාපාරයක් විය යුතුයි.	• ආපසු ගෙවීමේ කාලය උපරිම මාස 24 යි. • පොලී අනුපාතය නිසි අවස්ථාවේදී විමසා ලබාගත හැක. • ලේඛණ ගාස්තු වෙබ් අඩවියේ සඳහන් පරිදි වන අතර අදාල ගාස්තු අයදුම්කරු විසින් ගෙවිය යුතුයි. • සෑම ණය පහසුකම් ඉල්ලීමක්ම ණය ඇගයීමට භාජනය කරන අතර ණය අනුමත කිරීම සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ඒකමතික තීරණය මතවේ. • ගිවිසුම්ගත පරිදි ණය ආපසු ගෙවීමට ණයගැනුම්කරු අපොහොසත් වුවහොත් ලබාගත් ණය මත සියළුම ප්‍රමාද ගාස්තු / අයකිරීම් / පොලී ගාස්තු යනාදිය සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් වෙත ගෙවීමට ණයගැනුම්කරු වගකීම් දරයි.

මූල්‍යමය පහසුකම් / සේවාවන්	ඉලක්ක වෙළඳපොළ සහ ප්‍රධාන කරුණු	සුදුසුකම් ලැබීමේ නිර්නායන	විශේෂ කරුණු සහ කොන්දේසි
ඔඩසත ණය	❖ **ණය අයදුම්කරුවන්** • තනි පුද්ගලයින් • ඒක පුද්ගල ව්‍යාපාර • හවුල් ව්‍යාපාර • සීමිත වගකීම් සමාගම් ❖ **ණය අයදුම්කරුගේ ණය ලබාගැනීමේ නිර්නායන සි බි සි ෆිනෑන්ස් ලිමිටඩ් හි ණය දෙන නිර්දේශය හා අනුකූල විය යුතුයි.** ❖ **ආනයන ලියවිලි සමග වාහනයේ එන්ජිම හා චැසි අංක ගැලපීම තහවුරු කිරීම සඳහා ණය දෙන නිලධාරින් විසින් වාහනය පරික්ෂණයක් සිදු කරනු ඇත.** ❖ **ණය අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ණය අයදුම්පත සහ එහි සඳහන් අදාල ලියකියවිලි ඉදිරිපත් කල යුතුයි.**	❖ අයදුම්කරු ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතු අතර ණය ලබා ගැනීම සඳහා වූ නීත්‍යානුකූල වයස තුල සිටිය යුතුයි ❖ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම අඥාපනත යටතේ නිසි පරිදි ලියා පදිංචි කල ව්‍යාපාරයක් විය යුතුයි	• ආපසු ගෙවීමේ කාලය - උපරිම මාස 12 අවම මාස 01 • පොලී අනුපාතය නිසි අවස්ථාවේදී විමසා ලබාගත හැක. • ලේඛණ ගාස්තු වෙබ් අඩවියේ සඳහන් පරිදි වන අතර අදාල ගාස්තු අයදුම්කරු විසින් ගෙවිය යුතුයි. • සෑම ණය පහසුකම් ඉල්ලීමක්ම ණය ඇගයීමට භාජනය කරන අතර ණය අනුමත කිරීම සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ඒකමතික තීරණය වේ. • වාහන වර්ග - කාර රථ, වෑන් රථ, ජීප් රථ සඳහා පමණක් සීමා වේ. • ජපානය ඉන්දියාව මැලේසියාව හා කොරියාවේ නිෂ්පාදිත හා යුරෝපා වාහන වලට සීමාවේ. • ගිවිසුම්ගත පරිදි ණය ආපසු ගෙවීමට ගණුදෙණු කරු අපොහොසත් වුවහොත් ලබාගත් ණය මත සියළුම ප්‍රමාද ගාස්තු / අයකිරීම් / පොලී ගාස්තු යනාදිය සි බී සී ෆිනෑන්ස් ලිමිටඩ් වෙත ගෙවීමට ගණුදෙණුකරු වගකීම් දරයි.

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2018 අංක 01 දරණ නියෝගය මත මූල්‍යමය පාරිභෝගික ආරක්ෂා පනතට අනුකූලව මෙම ලේඛණ ඉදිරිපත් කරන ලදි.

මූල්‍යමය පහසුකම් / සේවාවන්	ඉලක්ක වෙළඳපොල හා ප්‍රධාන කරුණු	සුදුසුකම් ලැබීමේ නිර්ණායක	විශේෂ කරුණු සහ කොන්දේසි
උකස් ණය	❖ **ණය අයදුම්කරුවන්** • තනි පුද්ගලයින් • ඒක පුද්ගල ව්‍යාපාර • හවුල් ව්‍යාපාර • සීමිත වගකීම් සමාගම් ❖ **ණය අයදුම්කරුගේ ණය ලබාගැනීමේ නිර්ණායක සි බි සි ෆිනෑන්ස් ලිමිටඩ් හි ණය දෙන නිර්දේශය හා අනුකූල විය යුතුයි.** ❖ **ණය අයදුම්කරු ඇගයීමේ කොටසක් වශයෙන් ණය දෙන නිලධාරීන් (සුරැකුමට තබා ඇති දේපොල වන නිවෙස් / ව්‍යාපාර) ස්ථාන වෙත පැමිණේ.** ❖ **ණය අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ණය අයදුම්පත සහ එහි සඳහන් අදාල ලියකියවිලි ඉදිරිපත් කල යුතුයි.**	❖ අයදුම්කරු ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතු අතර ණය ලබා ගැනීම සඳහා වූ නීත්‍යානුකූල වයස තුල සිටිය යුතුයි. --- ❖ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම අධ්‍යාපනත යටතේ නිසි පරිදි ලියා පදිංචි කල ව්‍යාපාරයක් විය යුතුයි.	• කෙටි කාලීනහා මධ්‍යම කාලීන ණය ආපසු ගෙවීමේ කාලය මාස 01 සිට මාස 72 • ව්‍යාපෘති සඳහා උපරිම මාස 120 යි. • පොලී අනුපාතය නිසි අවස්ථාවේදී විමසා ලබාගත හැක. • ලේඛණ ගාස්තු උකස් බැදුම්කර ගාස්තු වෙබ් අඩවියේ සඳහන් පරිදි වන අතර අදාල ගාස්තු අයදුම්කරු විසින් ගෙවිය යුතුයි. • සෑම ණය පහසුකම් ඉල්ලීමක් ණය ඇගයීමට භාජනය කරන අතර ණය අනුමත කිරීම සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ඒකමතික තීරණය මතවේ. • දේපල සුරැකුම් ලෙස ලබාදිය යුතුයි. • ගිවිසුම්ගත පරිදි ණය ආපසු ගෙවීමට ගණුදෙණු කරු අපොහොසත් වුවහොත් ලබාගත් ණය මත සියළුම ප්‍රමාද ගාස්තු / අයකිරීම් / පොලී ගාස්තු යනාදිය සි බී සී ෆිනෑන්ස් ලිමිටඩ් වෙත ගෙවීමට ගණුදෙණුකරු වගකීම් දරයි.

මූල්‍යමය පහසුකම් / සේවාවන්	ඉලක්ක වෙළඳපොල හා කරුණු	සුදුසුකම් ලැබීමේ නිර්නායනය	විශේෂ කරුණු සහ කොන්දේසි
කල්බදු	❖ **ණය අයදුම්කරුවන්** • තනි පුද්ගලයින් • ඒක පුද්ගල ව්‍යාපාර • හවුල් ව්‍යාපාර • සීමිත වගකීම් සමාගම් ❖ **ණය අයදුම්කරුගේ ණය ලබාගැනීමේ නීර්නායන සි බි සි ෆිනෑන්ස් ලිමිටඩ් හි ණය දෙන නිර්දේශය හා අනුකූල විය යුතුයි.** ❖ **වාහන ලියාපදිංචි සහතිකය, ඉන්වොයිසිය හා තක්සේරු වාර්තාව අනුව වාහනයේ එන්ජිම සහ චැසි අංකය සැසදන බව තහවුරු කිරිම සඳහා ණය දෙන නිලධාරින් වාහන පරික්ෂණයක් සිදු කෙරේ.** ❖ **යන්ත්‍රෝපකරණ සඳහා එහි අනුක්‍රමික අංක මාදිලි අංකය තක්සේරු වාර්තාව හා සසදා බැලේ.** ❖ **ණය අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ණය අයදුම්පත සහ එහි සඳහන් අදාල ලියකියවිලි ඉදිරිපත් කල යුතුයි.**	❖ අයදුම්කරු ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතු අතර ණය ලබා ගැනීම සඳහා වූ නීත්‍යානුකූල වයස තුල සිටිය යුතුයි. ❖ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම අඥාපනත යටතේ නිසි පරිදි ලියා පදිංචි කල ව්‍යාපාරයක් විය යුතුයි.	• ආපසු ගෙවීම උපරිම කාලය ලියා පදිංචි නොකල හා නව වාහන - මාස 72 යි. ලියා පදිංචි වාහන - මාස 60 යි. • ලීසිං ප්‍රවර්ධන සමයේ ලියකියවිලි ගාස්තු / මෝටර් රථ හුවමාරු කිරිමේ ගාස්තු වලට සහන හා තෑගි භාණ්ඩ පිරිනමනු ලැබේ. • පොලී අනුපාතය නිසි අවස්ථාවේදී විමසා ලබාගත හැක. • ලේඛණ ගාස්තු උකස් බැඳුම්කර ගාස්තු වෙබ් අඩවියේ සඳහන් පරිදි වන අතර අදාල ගාස්තු ද අයදුම්කරු විසින් ගෙවිය යුතුයි. • සෑම ණය පහසුකම් ඉල්ලීමක්ම ණය ඇගයීමට භාජනය වන අතර එය අනුමත කිරිම සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ඒකමතික තීරණයවේ. • වාහන වර්ග සීමා වනුයේ කාර රථ, වෑන් රථ, ජීප් රථ, ට්‍රක් රථ, බස් රථ, ද්විත්ව හා විශේෂ අවශ්‍යතා වාහන සඳහා සහ යන්ත්‍රෝපකරණ අදාලවේ. • ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝග පරිදි LTV ගිණුම්කරණ අනුපාතය අයදුම්කරුගේ ණය වටිනාකම මත ගණණය කෙරේ. • ගිවිසුම්ගත පරිදි ණය ආපසු ගෙවීමට ගණුදෙණු කරු අපොහොසත් වුවහොත් ලබාගත් ණය මත සියළුම ප්‍රමාද ගාස්තු / අයකිරීම් / පොලී ගාස්තු යනාදිය සි බි සී ෆිනෑන්ස් ලිමිටඩ් වෙත ගෙවීමට ගණුදෙණුකරු වගකීම් දරයි.

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2018 අංක 01 දරණ නියෝගය මත මූල්‍යමය පාරිභෝගික ආරක්ෂා පනතට අනුකූලව මෙම ලේඛණ ඉදිරිපත් කරන ලදි.

නිෂ්පාදනය/ සේවාව	ඉලක්ක වෙළඳපල සහ ප්‍රධාන අවශ්‍යතා	සුදුසුකම් නිර්ණායක	ප්‍රධාන නියම සහ කොන්දේසි
රන් ණය	<u>ඉලක්ක වෙළඳපොළ</u> ❖ මෙම සේවාව ස්වර්ණාභරණ නිෂ්පාදකයින් උකස් තැරැව්කරුවන් සහ ස්වර්ණාභරණ වෙළඳසැල් හිමියන් ඇතුළු ආයෝජන සහ සිල්ලර රන් ණය පාරිභෝගික කණ්ඩායම් දෙකම සඳහා අදහස් කෙරේ. <u>අත්තිකාරම් ලබා ගැනීම</u> ❖ පාරිභෝගිකයා ශාඛාවට පැමිණෙ රන් භාණ්ඩය ඉදිරිපත් කරයි ❖ රන් තක්සේරුකරු එය පරීක්ෂා කර ලබා ගත හැකි උපරිම මුදල යෝජනා කරයි ❖ පාරිභෝගිකයා තීරණය කරයි ❖ අනන්‍යතා සාක්ෂි ලබා ගනු ලැබේ ❖ රන් ණය නිලධාරියා විසින් රන් තක්සේරු වාර්තාව(GVR) පිරවිය යුතුය. ❖ පද්ධතිය විසින් ජනනය කරන ලද රන් ණය ටිකට්පත පාරිභෝගිකයා විසින් KYC සහ වන්දිපූර්ණ ලිපිය ද සමඟ අත්සන් කර මුදල් අයකැමි වෙත ගෙන යනු ලැබේ ❖ මුදල් අයකැමි ටිකට් පතේ නිරවද්‍යතාවය පරීක්ෂා කර ටිකට් පත සහ මුදල් පාරිභෝගිකයා වෙත භාර දෙයි <u>අවශ්‍ය ලිපි ලේඛන</u> ❖ ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රයේ පිටපතක්	❖ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා අයදුම්කරු නීත්‍යානුකූලව පිළිගත් වයස් සීමාව තුළ සිටින ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.	❖ CBSL මාර්ගෝපදේශ අනුව CBCF විසින් තීරණය කරන ලද උපරිම අත්තිකාරම් මුදල ❖ මුද්දර ගාස්තු, නීතිමය සහ අනෙකුත් ගාස්තු ඇතුළුව මෙම පහසුකමට අදාළ සියලුම වියදම් පාරිභෝගිකයා විසින් දැරිය යුතුය. ❖ එසේ ලබා දෙන මුදල පොලී සමඟ සම්පූර්ණයෙන්ම ආපසු ගෙවිය යුතුය. ❖ නියමිත දිනට ගෙවීම පැහැර හැරීම හේතුවෙන් අමතර පොලියක් අය කරනු ඇත. ❖ පැහැර හැරීමක් සිදුවුවහොත්, එම සම්පූර්ණ හිඟ මුදල ගෙවීමට ඉල්ලීමේ අයිතිය සමාගම රඳවා තබා ගනී. ❖ සුරැකුම් ලෙස තබා ඇති භාණ්ඩ අහිමි වුවහොත්, CBCF ණයගැතියාට ගෙවනු ලබන්නේ එවැනි නැතිවූ භාණ්ඩවල වෙළඳපල වටිනාකම පමණක් වන අතර CBCF වෙතින් වෙනත් අලාභයක් හෝ හානියක් ඉල්ලා සිටීමට ණයගැතියාට නීත්‍යානුකූල අයිතියක් නැත. ❖ උකස් පනතට අනුව සුරැකුමක් වශයෙන් ලබාදුන් භාණ්ඩය විකිණීමේ අයිතිය CBCF සතුය. ❖ ශ්‍රී ලංකා නීති පද්ධතියේ ප්‍රතිපාදන අනුව නීතිමය ක්‍රියාපටිපාටිය ගනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2018 අංක 01 දරණ නියෝගය මත මුල්‍යමය පාරිභෝගික ආරක්ෂා පනතට අනුකූලව මෙම ලේඛණ ඉදිරිපත් කරන ලදි.

			<u>භාණ්ඩ මුදාගැනීම</u> ❖ පාරිභෝගිකයා රන් ණය ටිකට් පත සමඟ පැමිණේ ❖ පාරිභෝගික අනන්‍යතාවය තහවුරු කළ යුතුය ❖ බේරුම් ශේෂය ගැන පාරිභෝගිකයා දැනුවත් කළ යුතුය ❖ පාරිභෝගිකයා මුදල් පියවයි ❖ මුදල් අයකැමි විසින් බේරුම්කරණ කුවිතාන්සියක් නිකුත් කරයි සහ පාරිභෝගිකයාගෙන් අත්සන ලබා ගනී ❖ ගනුදෙනුව සම්පූර්ණ කරන රන් ණය නිලධාරියාට මුදල් මුල් රන් ණය ටිකට්පත සහ පියවීමේ කුවිතාන්සියක් ලබා දිය යුතුය. ❖ මුල් පියවීම් කුවිතාන්සිය පාරිභෝගිකයා වෙත භාර දෙනු ලැබේ

සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ්

සමාගම්ණය දෙන නිශ්පාදන සඳහා තීරුබදු අනුපාත සහ පොලී අනුපාත.

විස්තරය	පහසුකම් මුදල	පහසුකම සඳහා ගාස්තුව	පොලී අනුපාත
ලීසිං/බිස්නස් ඩ්‍රාෆ්ට්/ බිස්නස් ඩ්‍රාෆ්ට්/වාහන ණය	Rs.100,000/- සිට ඉහළට	Rs.8,000/ (වාහන වර්ගය මත රඳා පවතී)	14% සිට ඉහළට
ක්ෂුද්‍ර ලීසිං(මෝටර් සයිකල්)	Rs.100,000/- සිට ඉහළට	Rs.6,200/-	23% සිට ඉහළට
ක්ෂුද්‍ර ලීසිං (ත්‍රී රෝද රථ)			20% සිට ඉහළට
රන් ණය	මාස 01	0.5% අත්තිකාරමක් සඳහා	19.2 % (වසරක කාලයක් සඳහා)
	මාස 03	0.5% අත්තිකාරමක් සඳහා	19.2 % (වසරක කාලයක් සඳහා)
	මාස 06	අදාල නොවේ	19.2 % (වසරක කාලයක් සඳහා)
	මාස 12	අදාල නොවේ	19.2 % (වසරක කාලයක් සඳහා)

සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ්

ප්‍රමාද ගාස්තු අනුපාත

කේතය	**නාමය**	**ප්‍රමාද ගාස්තු අනුපාතය (වාර්ෂිකව)**
101	කුලියට ගැනීමේ මූල්‍ය පහසුකම	0.48
110	වාණිජ ණය	0.48
131	පුද්ගලික ණය	0.48
141	වාහන ටොප්-අප් ණය	0.48
151	ගැණුම් සහ බදු ගිවිසුම් ණය	0.48
160	ප්‍රිමියම් වාණිජ පුද්ගලික ණය	0.48
170	සේවක පරිභෝජන ණය	0.48
180	ප්‍රිමියම් ව්‍යාපාර ණය – නො පුද්ගලික	0.48
161	ප්‍රිමියම් වාණිජ ණය – නො පුද්ගලික	0.48
181	ප්‍රිමියම් ව්‍යාපාර පුද්ගලික ණය	0.48
182	ව්‍යාපාරික ණය	0.48
190	වාහන උකස් ණය	0.48
183	මුදල් ආධාරක ණය	0.48
184	කාලීන ණය – කොවිඩ් සහනය I	0.48
185	කාලීන ණය – කොවිඩ් සහනය II	0.48
111	මෝටර් කෙටුම්පත් ණය	0.48
195	රන් ණය	0.09
196	සේවක රන් ණය	0.09
102	ද්වීරෝද ලීසිං	0.48
103	ත්‍රිරෝද ලීසිං	0.48
104	ලීසිං කෙටුම්පත්	0.48
105	විශේෂ ලීසිං පහසුකම්	0.48
197	විශේෂ රන් ණය	0.09
198	රු. 500,000 ඉහළ රන් ණය	0.09
200	CBCF විශිෂ්ට රන් ණය	0.09
135	CBC වාහන ණය	0.48

සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් වෙතින් මූල්‍ය පහසුකම් හා සේවාවන් ලබා ගැනීමේ ක්‍රියාවලිය.

- ගණුදෙනුකරුවන් ළගම ඇති සී බී සී ෆිනෑන්ස් ශාඛා වෙත පැමිණීමෙන් හෝ සම්බන්ධවීමෙන් මූල්‍ය පහසුකම් / සේවාවන් පිළිබඳ විස්තර ලබා ගත හැක. අප වෙබ් අඩවියේ (www.cbcfinance.lk) ශාඛා පිහිටි ස්ථානය හා ඇමතුම් විස්තර සඳහන් කර ඇත.
- අදාළ මූල්‍ය පහසුකම / සේවාව ලබා ගැනීම සඳහා ගණුදෙනුකරුවන් විසින් අදාළ අයදුම්පත සහ ලියකියවිලි සම්පූර්ණ කළ යුතු අතර එය ශාඛා නිළධාරින් වෙත ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කළ යුතුයි. ගණුදෙණුකරු විසින් නිවැරදි තොරතුරු සැපයිය යුතුයි.

බද්ධ ගිණුම්

- බද්ධ ගිණුම්කරුගේ අභාවය හැකි ඉක්මනින් සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් වෙත දැනුම් දිය යුතු අතර අනෙක් බද්ධ ගිණුම්කරු එම තැන්පතුවේ හිමිකරු ලෙස සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් පිළිගනු ලැබේ.

පොලී අනුපාත

- පොලී අනුපාත නිර්දේශ කරනු ලබනුයේ ALCO (වත්කම් හා වගකීම් කළමණාකරණ කමිටුව) ප්‍රතිපත්ති මත නියාමන අධිකාරියෙන් නිකුත් කරන නිර්දේශයන්ට අනුකූලවය.
- ණය පහසුකම් සඳහා පොලිය නිර්දේශ වනුයේ ණය පහසුකම් වර්ගය ආපසු ගෙවීමේ කාලය සහ ඇප සුරක්ෂිතභාවය මත වන අතර වෙළඳපොළ කොන්දේසිවලට අනුකූලව පොලී මුදල කාලිනව වෙනස්වීම් වලට භාජනය වේ.
- තැන්පතු සඳහා ලබාදෙන පොලිය අපගේ වෙබ් අඩවියේ www.cbcfinance.lk සඳහන් කර ඇත.

මූල්‍යමය පහසුකම් සහ සේවාවන් සඳහා අදාළ නීතිමය ප්‍රතිපාදන

- 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත.
- 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනත.
- 1949 අංක 06 දරණ උකස් පනත, 1990 අංක 03 දරණ සංශෝධනය කරන ලද උකස් පනත.
- 1990 අංක 02 දරණ ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ ප්‍රතිපාදන) පනත.
- 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙණු වාර්තා කිරීමේ පනත.
- සිවිල් ක්‍රියාත්මක පටිපාටි සහ වෙනත් ශ්‍රී ලංකාවේ අදාළ නිති.

අක්‍රිය ගිණුම්

- අවුරුදු 10 කාලයක් තුලදී කිසිදු ගණුදෙනුවක් හෝ ලිපි හුවමාරුවක් සිදු නොකල තැන්පතු අක්‍රිය ගණයේ තැන්පතු ලෙප පලකන අතර 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනතට අනුව එම තැන්පතු විස්තර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කල යුතු වේ.

හෙළිදරව් කිරීම

- 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත 61(2) ප්‍රතිපාදන අනුකූලව සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් සියළුම ගණුදෙණු සම්බන්ධව රහස්‍යභාවය රකිනු ඇත.
- සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව සහ වෙනත් නීත්‍යානුකූල ව්‍යවස්ථාපිත නියාමන ආයතන නියෝගයන්ට අනුව ගණුදෙණුකරු වෙත පෙර දැනුම්දීමක් නොමැතිව ගණුදෙණු විස්තර ලබාදීමට සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් බැදී සිටී.
- ණය පහසුකම් විස්තර ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත ලබාදීමට සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් බැදී සිටී.

2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙණු වාර්තා කිරීමේ පනත

- 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙණු වාර්තා කිරීමේ පනතේ අංක 7 දරන ප්‍රතිපාදනයට අනුකූලව සියළුම නීතිවිරෝධී ගණුදෙණු මූල්‍ය අපරාධ අංශය වෙත වාර්තා කිරීමට සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් බැදී සිටී.

ණය අයකර ගැනීමේ ක්‍රියාපටිපාටිය

සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් විසින් ගණුදෙණුකරුවන්හට ණය මුදල් ආපසු ගෙවීමට පහසුකම් සලසා දෙනු ලැබේ. සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හි ණය අයකර ගැනීමේ ප්‍රතිපත්ති මාලාවට අනුකූලව ගණුදෙණුකරුගේ සිද්ධීන් සලකා බලා ණය ගෙවීමේ කාලසටහන් නැවත සකසා දීමෙන් සහ ගෙවීමට ඇති ණය මුදල නැවත ව්‍යුහගත කරදීමෙන් ගණුදෙණුකරු වෙත ණය මුදල් ගෙවා නිම කිරීම සඳහා පහසුකම් සලසා දෙනු ඇත.

එසේ කිරීමෙන් අනතුරුවද, ගණුදෙණුකරු විසින් ණය ආපසු ගෙවීමට අපොහොසත් වන්නේ නම්, සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හා ගිවිසුම්ගත පරිදි සහ ණය අයකර ගැනීමේ නීත්‍යානුකූල ක්‍රියාපටිපාටියට අනුව කටයුතු කිරීමට සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් හට සිදුවනු ඇත. එසේ නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයකට පිවිසීමේදී ඒ සඳහා වැයවන නඩු ගාස්තු සහ අදාළ වෙනත් ගාස්තු සී බී සී ෆිනෑන්ස් ලිමිටඩ් වෙත ගෙවීමට ගණුදෙණුකරු වගකීම් දරයි.

ගණුදෙණුකරුවන්ගේ පැමිණිලි විසඳීමේ ක්‍රියාපටිපාටිය

❖ **පැමිණිලි කිරීම :-**

➢ **පහත සඳහන් ඕනෑම ක්‍රමයක් ඔස්සේ ගණුදෙණුකරුවන්ට පැමිණිලි ඉදිරිපත් කළහැක.**
- ✓ අංක 187, කටුගස්තොට පාර, මහනුවර යන ලිපිනයට - අනුකූල්තා නිළධාරියා වෙත ලිඛිතව හෝ දුරකථන අංක 076 - 1755271 යට සම්බන්ධ වීමෙන්
- ✓ info@cbcfinance.com යන විද්‍යුත් තැපැල් මගින්
- ✓ www.cbcfinance.com වෙබ් අඩවිය හරහා
- ✓ පැමිණිලි පෙට්ටිය

➢ **පැමිණිලි සඳහා අවශ්‍යවන තොරතුරු:**
- ✓ ගණුදෙණුකරුගේ නම, හැඳුනුම්පත් අංකය, ගිණුම් අංකය, ජංගම දුරකථන අංකය හෝ විද්‍යුත් තැපැල්
- ✓ සිද්ධිය හෝ පැමිණිල්ල කෙටියෙන්

➢ **පැමිණිලි:**
- ✓ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා : .ගණුදෙණුකරුට ශාඛා කළමණාකරුගේ සහය ලබාගත හැක.
- ✓ නිර්නාමික පැමිණිලි / ප්‍රමාණවත් සාක්ෂි / සාධක නොමැති පැමිණිලි තිල පැමිණිලි ලෙස සලකනු නොලැබේ.

➢ **පැමිණිල්ල භාරගත් බව දැනුවත් කිරීම :-**
- ✓ පැමිණිල්ල භාරගත් බව තැපැල් / විද්‍යුත් තැපැල් මාර්ගයෙන් ගණුදෙණුකරු දැනුවත් කරන අතර, එය ඉදිරි පරීක්ෂණය සඳහා අදාල නිළධාරින් වෙත යොමු කරනු ඇත.

➢ **පැමිණිලි විමර්ශනය :-**
- ✓ සි බි සි ෆිනෑන්ස් ලිමිටඩ් විසින් පැමිණිලි සම්බන්ධව ගත් තිරණ හා පැහැදිලි කිරීම සහිතව ගණුදෙණුකරු වෙත ප්‍රතිචාර දක්වනු ලැබේ.
- ✓ දින 10 ක් ඇතුලතදී පැමිණිල්ල විමර්ශනය කිරීමට හා ප්‍රතිචාර දැක්වීමට සි බි සි ෆිනෑන්ස් ලිමිටඩ් අපොහොසත් වුවහොත් පැමිණිල්ල සඳහා ප්‍රතිචාර දක්වන දිනය ගණුදෙණුකරු වෙත ලබාදීමට කටයුතු කරනු ඇත.

මූල්‍ය ඔම්බුඩ්ස්මන් ශ්‍රී ලංකා
නො.01, බෙතෙස්ඩා පෙදෙස, මීලාගිරිය, කොළඹ 1
දු.ක- 0112595624/0112595625
fosril@sltlnet.lk

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2018 අංක 01 දරණ නියෝගය මත මූල්‍යමය පාරිභෝගික ආරක්ෂා පනතට අනුකූලව මෙම ලේඛණය ඉදිරිපත් කරන ලදි.